අලෙවිකරණය

# බී ලූණු නිෂ්පාදනය

අපේ ආහාර රසවත් කරන රතු ළූනු සහ බී ළූනු ප්‍රයෝජනවත් කුළුබඩු භෝග යන් වේ. රතු ළූනු ශ්‍රී ලංකාවේ විශාල ලෙස වගාකරනු ලැබුවත්, බී ළූනු සඳහා එවැනි තත්ත්වයක් දක්නට නොලැබේ වර්තමානයේදී රටේ බී ළූනු අවශ්‍යතාවයෙන් 90%ක්ම ඉන්දියාව සහ පාකිස්ථානය සහ අසල්වැසි රට වලින් ආනයනය කෙරේ 2% ක් පමණ වන දේශීය නිෂ්පාදනය පසුගිය වසර කිහිපය තුලදී විශාල වෙනස් වීම් වලට භාජනය වී ඇති බව නිෂ්පාදන තත්ත්වයන්ට අනුව පෙනෙන්නට තිබේ. එයට ප්‍රධානම හේතුව රතු ළූනු වලට මෙන් බී ළූනු වගා කටයුතු සඳහා ගොවීන් යොමු නොවීමයි. ශ්‍රී ලංකාවේ කාලගුණික සහ දේශගුණික තත්ත්ව යන් අනුව වියලි කලාපයේ සහ තෙත් කලාපයේ සමහර ප්‍රදේශවල සාර්ථක ලෙස බී ළූනු වගා කල හැකිය. වර්තමාන යේදී මාතලේ බදුල්ල රත්නපුර මොණරාගල යන දිස්ත්‍රික්ක වල වගා කටයුතු කෙරෙතත් එය එතරම්ම ව්‍යාප්තව නැත. වසර කිහිපයකට පෙර උතුරු පලාත සාර්ථක ලෙස බී ළූනු වගා කරමින් ඉදිරි යෙන්ම සිටියත් මෑතක සිට ඉහත සඳහන් කල ප්‍රදේශ එම තත්ත්වය හිමිකරගෙන ඇත.

දැනට ශ්‍රී ලංකාවේ වාර්ෂිකව හෙක්ටයාර් 10,000 ක් පමණ රතු ළූනු වගා කරන අතර මෙට්‍රික් ටොන් 60,000 ක් පමණ සාමාන්‍යයෙන් නිෂ්පාදනය කරනු ලැබේ. නමුත් වාර්ෂික දේශීය අවශ්‍යතාවය සලකා බලන විට එය ප්‍රමාණවත් නොවේ. රතු ළූනු සුලභව රටතුල තිබේ නම් වත් මත් මාසික බී ළූනු අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් 1500 ක් පමණ වේ. එසේ නොවන අවස්ථාවලදී එමෙන් පස් ගුණයකට අධික ප්‍රමාණයක් එනම් මෙට්‍රික් ටොන් 7000ක් මෙට්‍රික් ටොන් 8000 ත් අතර ප්‍රමාණයක් අවශ්‍ය වේ. වත්මන් බී ළූනු වගා බිම් ප්‍රමාණය මෙතෙක් හෙක්ටයාර් 300 ඉක්මවා නැති අතර, දේශීය වාර්ෂික නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2000 ක් පමණ වේ.

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී
ධනපාල ගොඩගේ විසිනි

දේශිය ඉල්ලුමට සරිලන සැපයුම දේශීය නිෂ්පාදනයෙන් ඉටු නොවන නිසා වාර්ෂිකව සාමාන්‍යයෙන් රතු ළූනු මෙට්‍රික් ටොන් 2000 ත් සහ බී ළූනු මෙට්‍රික් ටොන් 50,000 ක් පමණ ආනයන කර ඇති බව පසුගිය වසර කිහිපයක ආනයන දත්ත අනුව පෙනේ. රතු ළූනු ආනයනය සඳහා රු. කෝටි 2.5 ක් සහ බී ළූනු සඳහා රු. කෝටි 32.8 ක් පමණ වාර්ෂිකව වැයවේ. නමුත් දේශිය අවශ්‍ය තාවය ඉතා පහසුවෙන් මෙරටෙහිම නිපද වීමට ඉතා පහසු බව දේශීය සහ විදේශීය විද්‍යාඥ යින් දැනට දශක කිහිපයකට පමණ පෙර පෙන්වා දී ඇත. කෙසේ වුවත් වර්තමාන අවශ්‍යතාවයන් සලකා බලන විට දේශීය අවශ්‍යතාවය සපුරා ලීමට නම් හෙක්ටයාර් 5000 ක් පමණ බී ළූනු වගා කල යුතු වෙයි.

බී ළූනු වියදම් අධික වගාවකි. අක්කර 01 වගා කිරීම සඳහා රු. 10,000 ක් පමණ වැයවේ. මෙපමණ මුදලක් වැය වේයයි ගණන් බලා ඇත්තේ ඒ සඳහා යොදවන සෑම යෙදවුමක් සඳහාම මිල නියම කිරීමෙනි. මෙලෙස අවම යෙදවුම් යටතේ වුවද අක්කරයකට මෙට්‍රික් ටොන් 3 ක් පමණ අස්වැන්නක් ලබාගත හැකිය. ප්‍රශස්ථ මට්ටමේ යෙදවුම් භාවිතයෙන් මෙට්‍රික් ටොන් 5 කට වඩා ඉහල අස්

වැන්නක් ලබාගත හැකි බව කෘෂිකර්ම දෙපාර්ත මේන්තුවේ ක්ෂේත්‍ර අත්හදා බැලීම් වලින් හෙලිවී ඇත. එවැනි යෙදවුම් තත්ත්ව යටතේ සාමාන්‍යයෙන් රු. 15.000 ක් පමණ ඉතා ඉහල නිෂ්පාදන වියදමක් දැරිය යුතුවේ

**'බීළුනු' අක්කරයක් සඳහා වගා වියදම**

| | |
|---|---|
| බීජ | රු. 1350.00 |
| දිලීර නාශක | රු. 612.00 |
| පොහොර | රු. 1980.00 |
| ඉඩම් කුලිය | රු. 450.00 |
| රැකබලා ගැනීම | රු. 4320.00 |
| වෙනත් වියදම් | රු. 1980.00 |
| මුළු වියදම | රු. 10692.00 |

මූලය: සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය (බදුල්ල)

බීළුනු බීජ නිෂ්පාදනය දැනට ශ්‍රී ලංකාවේ නැත. අවශ්‍ය බීජ ප්‍රමාණයන් ආනයනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් සහ බීජ ගෙන්වීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවූ පෞද්ගලික සමාගම් මගින් කරනු ලැබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පූනාරෙඩ් නම් බීළුනු බීජ වර්ගය පමණක් ගෙන්වා බෙදා හරින අතර පෞද්ගලික අංශය මගින් රෙඩ් බෙන්ගාල්, ටේක්සාස් අර්ලිග්‍රැනෝ සහ රෙඩ් ක්‍රියලෝ යන බීජ වර්ග බෙදා හැරීම කරයි.

මනා යෙදවුම් සහ මනා කාලගුණ තත්ත්වයන් යටතේ වගා කරන ලද හොඳින් වැවුනු බීළුනු වගාවකින් සරු අස්වැන්නක් ලබාගත හැකිය. ඒ අනුව හෙක්ටයාර් 01 කින් මෙට්රික් ටොන් 12 කට වැඩි අස්වැන්නක් ලබාගත හැකිය. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා අනුව පසුගිය කාලයේ හෙක්ටයාර් 01 ට ලැබුනු සාමාන්‍ය අස්වැන්න මෙට්රික් ටොන් වේ. එසේම පසුගිය කාලපරිච්ඡේදයේදී හෙක්ටයාරයකට ලැබුන වාර්තාගත ඉහලම අස්වැන්න වන මෙට්රික් ටොන් 15 ක ප්‍රමාණය 1978 දී ලබාගෙන ඇත.

පසුගිය කාලයේ මාතලේ, අනුරාධපුරය, බදුල්ල, රත්නපුර සහ කිලිනොච්චි වැනි දිස්ත්‍රික්ක වල බීළුනු ගොවීන් හෙක්ටයාරයකට ලබා ඇති සාමාන්‍ය අස්වැන්න මෙට්රික් ටොන් 10 ඉක්මවයි. මේ අනුව හෙක්ටයාර් 01 ට මෙට්රික් ටොන් 10 ක පමණ සාමාන්‍ය අස්වැන්නක් ශ්‍රී ලංකාවේ කාලගුණික දේශගුණික තත්ත්වයන් යටතේ ලබාගත හැකි බව අපට අනුමාන කල හැක. මෙය අක්කරයකට මෙට්රික් ටොන් 04 ක් පමණ වේ.

අක්කර 01 ක නිෂ්පාදනය මෙට්රික් ටොන් 4 සහ අක්කරයක වියදම වන රු. 10,000 අනුව සලකා බැළුවහොත් කිලෝ ග්‍රෑම් 1 ක් සඳහා නිෂ්පාදන වියදම වන්නේ රු. 3.00 කටත් වඩා අඩු මුදලකි, වෙලඳපොලේ වර්තමානයේ අලෙවියට ඇත්තේ ආනයනික බීළුනු කිලෝ ග්‍රෑම් 1 ක් සඳහා නියම වූ මිල රු. 16 සිට 20 අතර ප්‍රමාණයකි. සතොස මගින් නිකුත් කරන තොග මිල කිලෝ ග්‍රෑම් 1 ක් සඳහා රු. 14 කි. 1986 වසරේ දී බීළුනු වගාකල මාතලේ, කිලිනොච්චි, බදුල්ල සහ මොණරාගල වැනි ප්‍රදේශවල ගොවීන් ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කර ඇත්තේ කිලෝ ග්‍රෑම් 1 සඳහා රු. 10-13 අතර මිල ගණන් වලටයි. සාමාන්‍යයෙන් මේ තත්ත්වයන් යටතේ කිලෝ ග්‍රෑම් 01 විකිණීමට හැකි වන මුදල රු. 10.00 ලෙස සැලකුවොත් එසේම අක්කර 01 න් මෙට්රික් ටොන් 4 ක් එනම් කිලෝ ග්‍රෑම් 4000 ක් ලබා ගැනීමට හැකි නම් අක්කරයකින් ලැබෙන ආදායම රු. 40.000 ක් පමණ වේ. උපරිම වශයෙන් අක්කර 01 න් ලැබෙන ආදායම රු. 30,000 ක් වුවත් නිෂ්පාදන වියදම සමග සසඳා බලන විට රු. 20,000 ක් පමණ ලාභයක් ලබාගත හැක.

බීළුනු වගාව සාර්ථකව කරගෙන යාමට නම් දැඩි අවධානයක යොමු කල යුතුය. තවාන් කාලයේදී බීළුනු පැල දිලීර රෝගවලට ගොදුරු වීමේ හැකියාව වැඩි නිසා ඒ කාලයේදී දැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ. අයහපත් කාලගුණ තත්ත්වය වගාවට ඔරොත්තු දෙන්නේ නැත. මේ නිසා ශ්‍රී ලංකාවේ බීළුනු වගාව යල් කන්නයේදී වාරි ජල

යෙන් හෝ උස්සාන වාරි ජලය භාවිතයෙන් කරනු ලැබේ.

ක්ෂේත්‍රය තුළ පැල සිටුවා අස්වැන්න නෙලන කාලය දක්වා හානියක් සිදුවන්නේ පැල මැක්කාගෙන් පමණි. ඒ හැර වෙනත් කෘමි උවදුරක් ශ්‍රී ලංකාවේ බීළූනු වගාවට තවම ඇති බවට සාක්ෂි නැත. කෘමි උවදුර අඩුවුවත් ක්ෂේත්‍රයේ ඇති බීළූනු බල්බවලට හානි සිදුවීමට ඇති නැමියාව ඉතාමත් වැඩිය. එවැනි තත්ත්වයක් ඇති වන්නේ බොහෝ විට දුර්වල ජල වහනය, අයහපත් දේශගුණය, සුදුසු බිම් තෝරීමේ දුර්වලතාවය, වැඩිපුර ජල සම්පාදනය, ක්ෂේත්‍රය අවට අවහිරය. තුලිත පොහොර මිශ්‍රණයක් නොයෙදීම අරපරිස්සමින් තොරව පොහොර යෙදීම සහ ක්ෂේත්‍රය තුළ පැල ගහනත්වය වැඩි වීම වැනි කරුණු හේතු කොට ගෙනයි.

මෙවැනි හේතූන් වලින් බීළූනු බල්බ කුණුවීම ආරක්ෂා කර ගැනීමට ඒ සඳහා දැඩි අවධානයකින් යුතුව වගා කටයුතු කල යුතුය. නිර්දේශිත පොහොර යෙදීම හොඳ ජලවහනයක් ඇති බිමක් තෝරා ගැනීම සහ භූමියේ ඈලවල් ඝණත්වයක් නොවන අයුරින් පැල සිටුවීම වැනි කටයුතු මගින් ඉහතින් සඳහන් දුර්වලතා වලක්වා ගත හැකිය.

අනිකුත් බෝගයන් සමග සසඳා බලන විට සාර්ථක බීළූනු වගාවකින් ලද හැකි ආදායම සාපේක්ෂව විශාල වුවත් ගොවීන් ඒ සඳහා තවමත් යොමු නොවීමට බලපා ඇති හේතු කිහිපයක් හඳුනා ගත හැක.

1. අනිකුත් බෝගයන්ට සාපේක්ෂව දැඩි අවදානමකින් යුක්ත වීම.
2. වගා කටයුතු සාර්ථක කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් දැනුම ගොවීන් බොහොමයකට තවමත් නොතිබීම
3. නිෂ්පාදන වියදම් අධිකවීම
4. සමහර ප්‍රදේශවලට ප්‍රමාණවත් තරම් බීජ නොතිබීම
5. ප්‍රමාණවත් බැංකු ණය පහසුකම් ලබා ගැනීමට අපහසු වීම
6. අස්වැන්න සුදුසු මිලකට විකිනීමට නොහැකි වේ යයි ගොවීන් තුළ ඇති අනියත බිය.

මෙවැනි හේතූන් නිසා බීළූනු වගාවේ ව්‍යාප්ත වීම තවමත් නිසියාකාරව ශ්‍රී ලංකාවේ සිදුවී නැත. සාර්ථක ලෙස බීළූනු වගා කිරීමට හැකිව තිබියදීත් විශාල විදේශ විනිමයක් මේ හේතුවෙන් වර්ෂයකට අපට වැය කිරීමට සිදුව තිබේ. එනිසා තවදුරටත් මෙරටේ බීළූනු අවශ්‍යතාවය සපුරා ගැනීමට ආනයනය මත රැඳී නොසිට මෙරටෙහිම නිෂ්පාදනය කර ගැනීමට අවශ්‍ය පියවර ඉතා ඉක්මණින් ගත යුතු වේ.